# වෙරළ සංරක්ෂණය

**එස්. ආර්. අමරසිංහ**

අධ්‍යක්ෂ, වෙරළ සංරක්ෂණ අංශය, ධීවර අමාත්‍යාංශය.

ඈත අතීතයේ පටන් ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපය මෙරට සංවර්ධනාත්මක ශිෂ්ඨාචාරයක් පෝෂණය කොට මූර්තිමත් කර ඇත. වෙරළබඩ කලාපයෙන් උද්ධරණය කළ හැකි සම්පත් සඳහා වූ ඉල්ලුම වැඩිවීමත් සමගම, මිනිසාගේ යහපත සඳහා වැදගත් අංගයක් වන මෙය අනතුරට මුහුණ පා ඇත. වෙරළබඩ පරිසර පද්ධතිය අතිශයින් සියුම්වීම නිසා, පරිසරයේ ස්ථායිතා වෙහි පැවැත්ම සඳහා එහි සම්පත් සුපරීක්ෂාකාරීව පාලනය කළ යුතුව ඇත.

වෙරළ බඩ පරිසරය පිරිහී ඇති බව පසුගිය දශක කිහිපය ඇතුළත ජාතික ක්‍රමසම්පාදන කාර්යාවලිය මගින් පිළිගනු ලැබූ අතර, සම්පත් සංරක්ෂණය හෝ සැලැස්මක් අනුව සම්පත් උප යෝගී කරගැනීම ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල වෙසෙන ජනතාවට අලුත් දෙයක් නොවේ. අරිප්පු ප්‍රදේශයෙන් දකුණෙන් කොන්ඩච්චි හා පොම්පරිප්පු සහ මන්නාරමෙහිදී මුතුබෙල්ලන් ඇල්ලීම රජය විසින් දැඩිලෙස සීමාකොට ඇති බව සහ, වර්ෂයේ සති 6 ක කාලයක් ඇතුළත පමණක් බෙල්ලන් ඇල්ලීමට අවසර දෙනු ලබන බවද, මුහුදෙහි ඇති බෙල්ලන් සංඛ්‍යාව නිර්ණය කිරීම සඳහා සමීක්ෂණ පවත්වනු ලබන බවද 1803 හිදී ශ්‍රී ලංකාවට පැමිණි රොබට් පර්සිවෙල් නමැති ඉංග්‍රීසි ජාතිකයා සඳහන් කර ඇත.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 50% ක් පමණ මුහුදුබඩ ප්‍රදේශ යෙන් නඩත්තු වෙති. මෙම ප්‍රදේශවල ජනගහනය තව තවත් තීව්‍ර වීමත් සමගම මෙම ප්‍රදේශවල පාරිසරික ප්‍රශ්නද තවත් උග්‍ර වනු ඇත. වෙරළ බඩ සම්පත් උපයෝගී කරගනු ලබන කාර්යයන් පහත දැක්වේ.

(1) වරාය පහසුකම්; වෙළඳාම, කර්මාන්ත හා තෙල් ළිං.
(2) වෙරළ බඩ විවේක ස්ථාන; ධීවර යාත්‍රා නවතා තැබීම, අළුත්වැඩියා කිරීමේ කටයුතු සහ මාළු පිරි සැකසුම සඳහා ධීවර වරාය.
(3) කසල අපවහනය සහ රසායනික ද්‍රව්‍ය වලින් අපවිත්‍ර වූ අභ්‍යන්තර ජල මාර්ග අපහරණය.
(4) ලුණු ලේවාය වලට කරදිය ලබා ගැනීම.
(5) වාණිජ කටයුතු උදෙසා ඛනිජ ද්‍රව්‍ය ලබා ගැනීම.
(6) ගමනාගමනය හා පරිවහනය.
(7) පවිත්‍ර මුහුදු වෙරළ හා උණුසුම් පිරිසිදු මුහුදු ජලය අවශ්‍යාංග වන විනෝදාත්මක කටයුතු.
(8) සමුද්‍රජීවීන්ගේ නිශ්පාදකතාවයට රුකුල් දෙන ස්වාභාවික සම්පත්.
(9) පුද්ගලික වාසය සඳහා නිවාස සංවර්ධනය.
(10) මුහුදේ හා මිනිසාගේ විනාශකාරී කටයුතු වලින් සමුද්‍ර තීරය ක්ෂයවීම නිසා ක්‍රියාත්මක වන වෙරළ ආරක්ෂා කිරීමේ කටයුතු.

වෙරළබඩ කලාපය වෙන් වශයෙන් නොව මුළු පරිසරයේ එක් අංශයක් වශයෙන් සැලකිය යුතු බව මින් පෙනේ. දිවයිනක පරිසර පද්ධතීන් සංරක්ෂණය කිරීමේදී වෙරළ බඩ පරිසර සංරක් ෂණය අතපසු කළ නොහේ. එමනිසා ශ්‍රී ලංකාවේ වෙරළ බඩ කලාපය කාර්යක්ෂම ලෙසින් හා සීඝ්‍රයෙන් සංරක්ෂණය කිරීමේ කාර්ය තවත් කල් දැමිය නොහේ.

**පසුබිම.**

පසුගිය දශකය තුලදී වෙරළ බඩ කලාපය ඇතුළත පිහිටි විවිධ කාර්යයන්හි සැහෙන ප්‍රමාණයක මුදලක් ආයෝජනය කර ඇත. උදාහරණ වශයෙන්, මුහුද අසබඩ හෝටල් කර්මාන්තයෙහි රු. දශ ලක්ෂ 350, ධීවර වරාය හා ගොඩබිම් පහසුකම් සැලසීම සඳහා රු. දශ ලක්ෂ 120, වරාය සංවර්ධනය සඳහා රු. දශ ලක්ෂ 50, සහ ලුණු ලේවාය සංවර්ධනය කිරීම සඳහා රු. දශ ලක්ෂ 15 ක් ආදී වශයෙන් මුදල් වැය කොට ඇත. මීට ප්‍රති විරුද්ධව මෙහි සංවර්ධනය සඳහාම අතිශයින් වැදගත්වූ ප්‍රදේශය සංරක්ෂණය සඳහා මුදල් යෙදවීමක් කර නැතැයි කිවහැකි තරම්ය. 1978 ජනවාරි මස සිට ශ්‍රී ලංකාවේ වෙරළ බඩ කලාපයෙහි ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම, පිළිසකර කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ධීවර අමාත්‍යාංශයෙන් වෙරළ බඩ සංරක්ෂණ අංශය යනුවෙන් වූ ආයතනයක් රජය දැන් පිහිටුවා ඇත.

ඛාදනය, පරිසර දූෂණය, සැලසුම් විරහිත සම්පත් උද්ධරණය හා පරිශීලන පරස්පර විරෝධිතා නොසලකා ආරම්භ කරනු ලබන අවස්ථාවෝචිත ව්‍යාපාර ආදිය හේතුකොට ගෙන මුහුදු බඩ ප්‍රදේශ බොහෝ විනාශයට පත්ව ඇත. අහිතකර මුහුදු තත්වයන්, කොරල් පර හා වැලි ඉවත් කිරීම, මඩ කැණුම් පස් වෙරළ අසබඩ ගෙනැවිත් දැමීම, නැව් පතුල පිහිටි තෙල් ටැංකි වලින් ඉවත්වූ තෙල් වෙරළ කරා ගලා ඒම, ඩයිනමයිට් භාවිතයෙන් මාලු ඇල්ලීම, සංචාරක ව්‍යාපාර සඳහා වෙරළ බඩ සම්පත් වැඩි වශයෙන් උපයෝගී කර ගැනීම ආදී කටයුතු මීට සහේතුක සාධක සමහරකි. වාණිජ ව්‍යාපාර උදෙසා පර විනාශ කිරීම කොරල් මත අවසාදිත තැන්පත්වීම, කසල අපවහන හා කාර්මික අපවාහ වලින් ඇතිවන බලපෑම හා ජලගැල්ම ඇති විටදී අධික ලෙස මිරිදිය ගලා ඒම ආදිය හේතුකොටගෙන විශේෂයෙන්ම කොරල් පර වලට හානි පැමිණේ.

පසුගිය අවුරුදු සය ඇතුලත, හික්කඩුව වෙරළ අඩි 1000 කින් පමණ රට තුලට මැත්ව ඇති බැවින් සැතපුම් 2 කක සමුද්‍ර තීරය ඔස්සේ රු. දශ ලක්ෂ 10 ක ඉඩම් ප්‍රමාණයක් අහිමිවී ඇත. වෙරළ බඩ කලාපයෙන් අවුරුද්දකට ටොන් 10,000 කට අධික ප්‍රමාණ යක් ඉවත් කර ගන්නා බවද නිරිත දිග වෙරළ බඩ ප්‍රදේශයෙන් පමණක් වැලි ඝන යාර 300,000 ක් ඉවත් කර ගන්නා බවද ඇස්ත මේන්තු කර ඇත. අවුරුද්දකට රුපියල් කෝටියක පමණ පිරි වැටුමක් සහිත වූ වෙරළ බඩ හුණු කර්මාන්තය, ගොඩනැගීමේ ව්‍යාපාරයට අවශ්‍ය හුණු ලබාගත හැකිවන අයුරින් හා මුහුදේ විනාශකාරී ක්‍රියාවලියෙන් ස්වාභාවික ආරක්ෂක මාර්ගයක් වශ යෙන් ද පැවැත්වෙන අයුරින් සැලසුම් කළයුතුව ඇත. සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වලින් හුණුගල් ලබා ගැනීමට ඇති හැකියාව ඇගයුම, එබඳු ස්ථාන වලින් හුණුගල් ලබා ගැනීම, මෝයවල් කලපු හා වෙරළෙන් ඔබ්බෙහි වූ තෝරාගත් ප්‍රදේශ වලින් වැලි ලබා ගැනීම ආදිය අවශ්‍යයෙන්ම කළ යුතුව ඇත.

රජය විසින් වෙරළ සංරක්ෂණය සඳහා සැළසුම් කළ වැඩ සටහනක් අවශ්‍යතාවය පිළිගන්නා ලදුව, ඒ සඳහා අවශ්‍ය ව්‍යවස්ථා සම්පාදනය කරනු වස් 1972 හිදී වෙනමම සංවිධානයක් පිහිටුවන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් සේවක මණ්ඩල පුහුණුව උදෙසා සීමිත වැඩසටහනක් ආරම්භ කරන ලදුව, 1975 හිදී, වෙරළ බඩ ඉන්ජිනේරු ශිල්පී පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවන ලදී.

**වර්තමාන තත්වය.**

1978 ජනවාරියෙහිදී ධීවර අමාත්‍යාංශයෙහි වෙරළ සංරක්ෂණ අංශයක් පිහිටුවීම සඳහා 1977 නොවැම්බර් මස තීරණය කරනු ලැබීමත් සමගම, වෙරළ සංරක්ෂණය පිළිබඳ සැලසුම් කළ වැඩ සටහනක් දියත් කිරීම සඳහා නිශ්චිත පියවර ගනු ලැබීන. මුළු මහත් පරිසරයට අදාලව වෙරළ සංරක්ෂණය පිළිබඳ සුපර්යාප්ත

ප්‍රතිපත්තියක් නිර්මාණය කරනු වස් වෙරළ සංරක්ෂණ පිළිබඳ නව ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබිණ. මෙම නව නීතිය ලඟදීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වැඩසටහනේ පරමාර්ථයන් මුදුන්පත් කරනු පිණිස වෙරළ හා සම්බන්ධී පර්යේෂණ, වෙරළ පිළිබඳ කටයුතු හා වෙරළ බඩ සම්පත් සංවර්ධනය උදෙසා ආධාර සැපයීමට හැකි වන අයුරින් වෙරළ සංරක්ෂණ අංශය සැලසුම්කර ඇත. වෙරළ බඩ ඉංජිනේරු පර්යේෂණ මධ්‍යස්ථානය මගින් රාජ්‍ය හා පුද්ගලික අංශයට වෙරළ හා සම්බන්ධ ගැටළු පිළිබඳ උපදෙස් ලබාදෙනු ලබන අතර, ව්‍යාප්ති පදනමක් මත වෙරළ ආරක්ෂක ගොඩනැංවීම්, නිර්මාණය හා ඉදිකිරීම වෙරළ බඩ කාර්ය ඒකකය මගින් ඉටු කරනු ලැබේ. වෙරළ බඩ සම්පත් සංවර්ධන අංශය, වෙරළ බඩ කලාපයේ සැලසුම් කළ සංවර්ධනය සඳහා වගකිවයුතු වන අතර විශේෂයෙන්ම වෙරළ සංරක්ෂණ නීති ක්‍රියාත්මක කරවීමෙහිලා එය වඩා සැලකිලිමත් වනු ඇත. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු පිළිබඳව සමීක්ෂණ හා අධ්‍යයන පවත්වනු ලැබේ.

(1) කොරල් හැරීම හා වැලි කැණීම ඇගයුම් කිරීම හා නව සැපයුම් මූලාශ්‍ර ගවේෂණය,

(2) වෙරළ බඩ සම්පත් ලේඛනයක් පිළියෙල කිරීම,

(3) අපවාහ, කොරල් විනාශය හා වෙරළ අපවිත්‍ර කිරීම ආදියෙන් පරිසරය කෙරෙහි ඇතිවන බලපෑම්.

වෙරළ අසබඩ පරිසරය විනාශවීමට තුඩුදෙන විවිධ කාර්යයන්හි නියුතු පුද්ගලයන් පිළිබඳ සමාජ ආර්ථික සමීක්ෂණ දැනට ආරම්භ කර ඇත. නව පරිසර සංරක්ෂණ වැඩ සටහනෙ අවශ්‍යතා ඉටු කිරීම සඳහා අවශ්‍ය අන්තර් ව්‍යුහය සංවර්ධනය කිරීමට අදහස් කොට ඇති අතර, වත්මන් සංවිධානාත්මක සම්පත් විභවය ඇතුලත සීමිත සංරක්ෂණ කාර්යයන් ද ඉටු කරනු ලැබේ.

**ව්‍යවස්ථා සම්පාදනය.**

වෙරළ ආරක්ෂාව සඳහා පණවා ඇති ව්‍යවස්ථා රජයේ ඉඩම් ආඥා පනතේ vii කොටසෙහි අන්තර්ගතව ඇත. මෙම ව්‍යවස්ථා වලින්, වෙරළ තීරයට බලපාන්නාවූ සංවර්ධන කටයුතු සඳහා බලපත්‍ර ලබාදීම හා වෙරළ තීරයෙන් ද්‍රව්‍ය ඉවත් කිරීම බලපත්‍ර මගින් තහනම් කිරීම හා යාමනය කිරීමත් සිදු කෙරේ. වෙරළ සංරක්ෂණය සඳහා උද්ගතවී ඇති නව අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව අතීත අත්දැකීම් වලින් පෙනේ. එබැවින් රජයේ ඉඩම් ආඥා පනතේ අදල වගන්ති අවලංගු කර නව ව්‍යවස්ථා සම්පාදනය කිරීමට තීරණය කරන ලදී. 1976 ඔක්තෝබර් මස ව්‍යවස්ථා කෙටුම්පත ජාතික රාජ්‍ය සභාව හමුවේ තබනු ලැබුවද, පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ නිසා, ඒ පිළිබඳව පියවර ගනු නොහැකි විය. 1977 හිදී තත්වය සමාලෝචනය කරනු ලැබූ විට සම්පූර්ණ වෙරළ අසබඩ පරිසරය අන්තර්ගත කෙරෙන අයුරින් ව්‍යවස්ථා යළි කෙටුම්පත් කරන ලදී. විවිධ ආඥා පනත් යටතේ, වෙරළ සංවර්ධනය පිළිබඳ වෙනත් නීති තිබූ බව මෙවිට සොයාගනු ලැබිණ. ඒවා නම්:

(1) වෙරළ බඩ කලාපයේ සංවර්ධනය පාලනය කිරීමට පළාත් පාලන මණ්ඩලවලට බලය තිබිණ.

(2) නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව වෙරළ බඩ ප්‍රදේශ ගණනාවක් සඳහා ඉඩම් පරිශීලන සැලසුම් පිළියෙල කර ඇත.

(3) වෙරළට මුහුණලා පිහිටි සංචාරක හෝටල සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය විය.

(4) කර්මාන්ත ශාලා කර්මාන්ත හා විද්‍යා කටයුතු සහ කම්කරු අමාත්‍යාංශවල බල සීමාවට හසු විය.

(5) කසල අපවහන ඉදි කිරීම ජල සැපයුම් හා ජලාපවහන මණ්ඩලය මගින් පාලනය කරනු ලැබේ.

(6) වෙරළ බඩ කලාපයේ පිරික්සීම් හා කැණීම් භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව යටතට හසුවේ.

(7) තවත් වෙනත් සංවර්ධන කටයුතු, කොළඹ වරාය කොමිසම ලංකා ධීවර වරාය සංස්ථාව හා අදල සංවිධානයන්හි කාර්ය ශ්‍රිතයට අයත් වේ.

එබැවින් නව සංරක්ෂණ නීති කෙටුම්පත් සම්පාදනය කිරීමේදී මෙම ව්‍යවස්ථා උචිත ලෙස සංශෝධනය කළ යුතු විය. පහත සඳහන් අවශ්‍යතා අන්තර්ගත වන පරිදි නව නීති කෙටුම්පත් ගත කරන ලදී.

(1) නව පනත මගින් සුපර්යාප්ත වෙරළ කලාපය පාලනය සඳහා ඉඩ තිබිය යුතුය.

(2) ව්‍යවස්ථා මගින්, වෙරළ කලාපීය සැලසුම් සංවිධානයක් පිහිටවනු ලැබිය යුතුය.

(3) ව්‍යවස්ථා මගින් කාර්යක්ෂම වෙරළ පාලන කාර්යයෙහි සමාජීය ප්‍රතිඵල අවධානයට ලක්විය යුතුය.

(4) නව පණත මගින් 1976 පණතෙහි දක්වා ඇතිවාට වඩා පෘථුල ලෙස ''වෙරළ බඩ කලාපය'' නිරුක්ති කළ යුතුය. ඉදිරි වෙරළ සිට කි.මී. 2 මුහුද දෙසට හා මීටර් 300 ක් ගොඩ බිම දෙසටද මෙම කලාපය ව්‍යාප්ත වන බව නව ව්‍යවස්ථා වෙහි දක්වේ.

(5) පරිසර බලපෑම ඇගයුම සඳහා ඉඩ සැලසිය යුතුය.

(6) විශාල තෙල් පිටාර ගැලීම් බඳුවූ තර්ජන වලින් වෙරළ ආරක්ෂා කර ගැනීමට සම්භාව්‍ය සැලැස්මක් සම්පාදනය කළ යුතුය.

(7) නව ව්‍යවස්ථා මගින් වෙරළ බඩ කලාපයේ සියළුම රාජ්‍ය සංවර්ධනාත්මක කටයුතු නිසි ලෙස සමායෝජනය කරනු ලැබිය යුතුය.

(8) වෙරළ බඩ ප්‍රදේශ අපවිත්‍ර වීම වැළැක්වීමට ඇති අවශ්‍යතාවය.

රටතුල ජලමාර්ග වලින් වෙරළ කරා අපවිත්‍ර දෑ පාවී ඒම පිළිබඳවද මෙහිදී සැලකිලිමත් විය යුතුය. යම් ජල මාර්ගයකින් වෙරළ බෙහෙවින් අපවිත්‍රවන බව වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂක වරයා අදල නිලධාරීන්ට දැන්වූ විට, ඔවුන් විසින් ඒ පිළිබඳව කටයුතු කරනු ලැබිය හැකිය. නිදහස් වෙළඳ කලාපයක් ප්‍රවර්ධනය කිරීමෙන් කාර්මීකරණය වඩාත් විශාල පරිමාණයකින් සිදුවීගෙන යන අවදියකදී මෙය වඩාත් වැදගත් ප්‍රශ්නයක් බවට පත්ව ඇත. යාබද ප්‍රදේශවල කාර්මීකරණය හේතුකොටගෙන මීගමු කලපුවෙහි උද්ගතවිය හැකි පාරිසරික බලපෑම් සැලකිල්ලට භාජනය විය හැකි මෙබඳු අවස්ථාවකි.

**පරිසමාප්තිය.**

අද පරිසරය දැඩි අවධානයට ලක්ව ඇති අතර, සම්බන්ධී සංවිධාන පුද්ගලයන් හා රජයද වෙරළ බඩ පරිසරය වර්තමාන මෙන්ම අනාගත පරම්පරාව උදෙසා ආරක්ෂා කොට යථා තත්වයට පත් කිරීම සඳහා සම්මුති ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතුය. මෙම පරමාර්ථය මුදුන්පත් කරගැනීම සඳහා රාජ්‍ය යෙදවුම් මගින් පමණක් නොව, ප්‍රචාරක ව්‍යාපාරයක් මගින්, වෙරළ බඩ පරිසරය විනාශවීමෙහි ආදීනව මහජන අවධානයට ලක් කිරීමෙන් වෙරළ බඩ වාසීන්ගේ සහභාගිත්වය ලැබ ගැනීමද අවශ්‍ය වේ. වෙරළ බඩ පරිසරය මුළුමහත් පරිසරයේ අංශයක් වන බව සිහිපත් කර ගෙන, අදල රාජ්‍ය ආයතන හා පුද්ගලික සංවිධාන වල සහයෝගීතාවයෙන් මෙම කර්තව්‍යයෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකිය.